# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2446/50 – 2025 ජූලි මස 24 වැනි බ්‍රහස්පතින්දා – 2025.07.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2016 දෙසැම්බර් මස 23 දින අංක 1998/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2016 අංක 300 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

කේ.ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්,
ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය : 4-3/6/2016/HW/179.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය : BER/4/5/5/09.
2025 මැයි මස 20 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පයාගල සහ දියලගොඩ ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KA/BRW/2016/419 හා 2016.10.04 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' - දුම්මලමෝදර, තුඩුවේවත්ත - ප්‍රමාණය : හෙක්. 0.0067**

උතුරට: හිමිකරු සොයාගත නොහැකි දුම්මලමෝදර, තුඩුවේවත්ත; නැගෙනහිරට: ගාලු පාර, කැබලි අක්ෂර C; දකුණට: කැබලි අක්ෂර C, එස්.ඩී.වීරකෝන් සහ හිමිකරු සොයාගත නොහැකි දුම්මලමෝදර, තුඩුවේවත්ත; බටහිරට: හිමිකරු සොයාගත නොහැකි දුම්මලමෝදර, තුඩුවේවත්ත.

02. **කැබලි අක්ෂර 'B' - දුම්මලමෝදර, තුඩුවේවත්ත - ප්‍රමාණය : හෙක්. 0.0002**

උතුරට: දුම්රිය දෙපාර්තමේන්තුව හිමිකම් කියන දුම්මලමෝදර, තුඩුවේවත්ත; නැගෙනහිරට: දුම්රිය දෙපාර්තමේන්තුව හිමිකම් කියන දුම්මලමෝදර, තුඩුවේවත්ත; දකුණට: දුම්රිය දෙපාර්තමේන්තුව හිමිකම් කියන දුම්මලමෝදර, තුඩුවේවත්ත සහ ගාලු පාර; බටහිරට: ගාලු පාර.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. **කැබලි අක්ෂර 'C' - දූම්මලමෝදර, තුඩුවේවත්ත - ප්‍රමාණය : හෙක්. 0.0157**

උතුරට: කැබලි අක්ෂර A සහ ගාලු පාර; නැගෙනහිරට: ගාලු පාර සහ කැබලි අක්ෂර D; දකුණට: කැබලි අක්ෂර D, හිමිකරු සොයාගත නොහැකි සහ එස්.ඩී. වීරකෝන් සහ හිමිකම් කියන දූම්මලමෝදර, තුඩුවේවත්ත; බටහිරට: එස්.ඩී. වීරකෝන් හිමිකම් කියන සහ හිමිකරු සොයාගත නොහැකි දූම්මලමෝදර, තුඩුවේවත්ත සහ කැබලි අක්ෂර A.

04. **කැබලි අක්ෂර 'D' - දූම්මලමෝදර, තුඩුවේවත්ත - ප්‍රමාණය : හෙක්. 0.0112**

උතුරට: කැබලි අක්ෂර C සහ ගාලු පාර; නැගෙනහිරට: ගාලු පාර සහ කැබලි අක්ෂර E; දකුණට: කැබලි අක්ෂර E, පී. උපාලි ගුණසේකර හිමිකම් කියන සහ හිමිකරු සොයාගත නොහැකි දූම්මලමෝදර, තුඩුවේවත්ත; බටහිරට: හිමිකරු සොයාගත නොහැකි සහ එස්.ඩී. වීරකෝන් හිමිකම් කියන දූම්මලමෝදර, තුඩුවේවත්ත.

05. **කැබලි අක්ෂර 'E' - දූම්මලමෝදර, තුඩුවේවත්ත - ප්‍රමාණය : හෙක්. 0.0072**

උතුරට: කැබලි අක්ෂර D සහ ගාලු පාර; නැගෙනහිරට: ගාලු පාර සහ කැබලි අක්ෂර G; දකුණට: කැබලි අක්ෂර G, ශාන්ත සෙබස්තියන් පල්ලිය සහ පී. උපාලි ගුණසේකර හිමිකම් කියන දූම්මලමෝදර, තුඩුවේවත්ත; බටහිරට: පී. උපාලි ගුණසේකර හිමිකම් කියන සහ හිමිකරු සොයාගත නොහැකි දූම්මලමෝදර, තුඩුවේවත්ත.

06. **කැබලි අක්ෂර 'F' - දූම්මලමෝදර, තුඩුවේවත්ත - ප්‍රමාණය : හෙක්. 0.0023**

උතුරට: දුම්රිය දෙපාර්තමේන්තුව හිමිකම් කියන දූම්මලමෝදර, තුඩුවේවත්ත; නැගෙනහිරට: දුම්රිය දෙපාර්තමේන්තුව හිමිකම් කියන දූම්මලමෝදර, තුඩුවේවත්ත; දකුණට: ගාලු පාර; බටහිරට: ගාලු පාර.

EOG 07 - 0308

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.